# අපේ සංගීතයේ විකාශනය



මිනිස් සංතානයේ ඇති වුන අනේක විධ වූ සෞන්දර්යාත්මක වූ සිතුම් පැතුම් නාද හා තාල සංකලනය උපයෝගී කර ගනිමින් විශ්ව භාෂාවක් ලෙස සංගීතය ලොවට දායාද කළේය. එය මිනිසාගේ ආරම්භයේ සිටම සම්බන්ධවෙමින් විකාශනය වූ අතර එම රටවල ආවේනික භාෂාවට, දේශයට හා තාලයට අනුකූල වෙමින් ඉදිරියට විකාශනය විය. අතීතයේ මිනිසා තම සිතෙහි සිතුවම් වූ සිතුම් පැතුම් විවේකයක් ලද විටදී එය ගල් ගුහාවේ බිත්ති පුරා සිතුවම් කිරීමටත් එය තවත් විටක තාලයකට අනුව ගායනයටත් පෙළඹී තිබුණි.

සංගීත ඉතිහාසයේ මුල්ම පියවර ගැමි සංගීතය ලෙස හැඳින්විය හැකිය. පැරණි ගැමි ජනතාව තම සිතට පැන නැගී තිබුණ යම්කිසි සෞන්දර්යාත්මික සිතුවිල්ලක් තාලය උපයෝගී කර ගනිමින් යම් රිද්මයකට අනුව ශබ්ද නගා ගායනය කළහ. කාලෝචිත වූත් අවස්ථානෝචිත වූත් යම් යම් කවි, ගීත රිද්මයකට අනුව ගායනා කළ අතර එම ගැමි ගී අප අතරට පැමිණ තිබේ. ඔවුන් විසින් නිර්මාණය කළ එම සුවිශේෂිත වූ ගායනා ගැමි ජනතාව අතර ජනප්‍රිය වූ අංගයක් බවට පත්විය.

අවිධිමත් අධ්‍යාපනයකින් ලැබුණ මෙම ගායනා ශෛලීය ගැමි සංගීතය වූ අතර ගැමි ජීවිත ක්‍රමයෙහි විවිධ අවස්ථාවලදී ගායනා කරන්නට යෙදුනි. ගමනා ගමනයෙහිදී කරත්තය විශේෂ උපකාරයක් ඔවුන්ගේ ජීවිත ගමනට එක්වූ අතර කරත්තයකින් දුර බැහැර ගමනක් යන අතර, ඇති වූ කාන්සිය වලක්වා ගැනීමට ඔවුන්ගේ දුක කියවුන කාව්‍ය විශේෂය කරත්ත කවි විය. ඒ අනුව පාරු කවි, ගොයම් කවි, පැල් කවි ආදී වශයෙන් තවත් නොයෙක් අවස්ථාවලදී සිවුන් ගායනා කළ කාව්‍ය සංගීතයට පසුකාලයදී එක්විය. පසුකාලීනව විධිමත් අධ්‍යාපන ක්‍රමයක් තුළින් පරපුරෙන් පරපුරට පැවැත ආ නාද රටා ජන සංගීතය නමින් පසුකාලීනව හැඳින්විය.

සංගීතය සමගම බිහි වූ නැටුම් කලාව දැඩි සම්බන්ධතාවයක් සංගීතය සමග ඇති වුවා පමණක් නොව එහි ආලෝකය සඳහාද එය ඉවහල් විය. මේ නිසා විවිධ ශබ්ද රටා බිහිවීමට හේතුවක් වූවා. පැරණි ගැමියා ශබ්ද රටා ඇති කිරීමට නම් හා දැව උපයෝගී කරගනිමින් විවිධ සංගීත භාණ්ඩ නිපදවූවා. මෙය සංගීතයේ ප්‍රගමනයට හේතු වූ ප්‍රබල සාධකයක් විය. බෞද්ධ පුද පූජා හා රාජසභා උත්සව සඳහා පංචතූර්ය නාදය ඇති කිරීම සඳහා මේ භාණ්ඩ මහඟු කාර්යක් සංගීතයේදි සිදු කළේය.

ශ්‍රී ලාංකීය ඉතිහාසයේ පසුකාලීනව විවිධ ජාතීන්ට යටත් වූ අප රට මුලින්ම පැමිණි පෘතුගීසී ජාතීන් ඔවුනට ආවේනික වූ කපිරිඤ්ඤා හා බැංජෝ සංගීතය අප්පෙ සංගීතයට සම්බන්ධවීම කඩඉමක් වූ බවක් පෙනේ. මේ නිසා කෙදි සහිත සංගීත භාණ්ඩ අපිට හිමි වූවා පමණක් නොව මැඩලීනය, ගිටාරය වැනි සංගීත භාණ්ඩද අපේ සංගීතයේදී සංගීතයට ඇතුළත් වූවා. මේ නිසා වේග රිද්ම රටාවකට අනුව නාද රටාව හසුරුවන බයිලා සංගීතය පසුකාලීනව අපේ දේශීය සංගීතයේම කොටසක් බවට පත්වූවා. මෙය ජනතාව අතර ජනප්‍රිය සංගීත කලාවක් බවට පත්වීමද නොවැලැක්විය හැක්කක්.

පසුකාලීනව අපේ රටට දකුණු ඉන්දියානු බලපෑම් දේශපාලන වශයෙන් බලපෑමේ ප්‍රතිඵලයක් ලෙස කර්ණාට සංගීතයේ අංශ වන ප්‍රශස්ති විරිදු වන්නම් අප සංගීතයට ඇතුළත්වීම නොවැළැක්විය හැක්කක් විය. එමෙන්ම නාඩගම් කෝලම් වලටද කර්ණාට සංගීතය ක්‍රමයෙන් ඇතුල්වීම පැහැදිලිව පෙනේ. එපමණක් නොව 1815 වැනි කාල වකවානුවලදී ඉංග්‍රීසීන්ට අප රට යටත් විජිතයක්ව පැවැතීමේ හේතුවෙන් බටහිර සංගීතය අපේ සිංහල සංගීතයට එකතුවීම සුවිශේෂිතවූ සිද්ධියක් විය. උසස් වූ ගායන ශෛලීයක් උරුම වූ බටහිර සංගීතයේ බලපෑමේ හේතුවෙන් තත්භාණ්ඩ තවදුරටත් අපේ සංගීත භාණ්ඩ අතරට පැමිණි තිබුණි.

විශේෂයෙන් ඩබල් බේස්, යතුරු පුවරු, ට්‍රම්පට් ඩ්‍රම්ස් වැනි සංගීත භාණ්ඩ ක්‍රමයෙන් අපේ සංගීතයට නැතිවම බැරි භාණ්ඩ බවට පත්විය. අපේ සංගීතයේ නව නැම්මක් ඇති කරමින් බොම්බායේ සිට පැමිණි පර්සි නාට්‍ය කණ්ඩායමක් මෙහිදී සංගීතය සඳහා විශේෂ මෙහෙවරක යෙදී තිබේ. මෙහි ප්‍රතිඵලයක් ලෙස ජෝන් ද සිල්වා, නීතිඥ චාල්ස් ද සිල්වා ගේ නාට්‍ය කණ්ඩායම් පවා බිහිවීමට හේතුවිය. විශේෂයෙන් මහා සංගීත සම්ප්‍රදායක් වන රාගධාරී සංගීතය අපට ලැබුණේ මේ බලපෑම්වල ප්‍රතිඵලයක් ලෙසිනි.
රවීන්ද්‍රනාත් තාගෝර් තුමා වර්ෂ 1935 දී පමණ ශ්‍රී ලංකාවට පැමිණීමත් හොරණ ශ්‍රී පාලි විදුහලට ගායන වාදන නැටුම් කණ්ඩායමක් සමග පැමිණීම නිසා ශ්‍රී ලංකාවේ සංගීත ඉතිහාසයේ නව පිටුවක් පෙරළා තැබීමට මෙය ඉවහල් විය. අපරදිග සංගීතය උත්තරභාරතීය හින්දුස්ථානී සංගීතය බෙංගාලි ගීත ශෛලීයද අපට ලැබීමද වැදගත් අවස්ථාවක් ලෙස සැළකිය හැකිය. එස්රාජය, බටනලාව, සිතාරය, තබ්ලාව වැනි භාණ්ඩ අපේ සංගීත භාණ්ඩ අතට පැමිණීම වැදගත් විය. පසුකාලයේදී තාගෝර්තුමාගේ විශ්ව භාරතීය ශාන්ති නිකේතනයට ගිය අපේ ශ්‍රී ලාංකිකයන් කිහිප පොලක් වංශ සංගීතයේ ආභාෂය ලංකාවට ලබාදීම වැදගත්. මෙහිදී විශේෂයෙන් ආනන්ද සමරකෝන් මකුලොලුව යන උගතුන් සඳහන් කිරීම වැදගත් වේ.

මේ අනුව විශ්ව භාෂාවක් වූ සංගීතය ශ්‍රී ලංකා සංගීත ඉතිහාසයේ විවිධ කඩඉම් රාශියක් පසුකොට දේශීය සංගීතයක් ලෙස අපේ භාෂාවට දේශයට හා සිරිත් විරිත්වලට අනුකූලව ගොඩ නැගුණක් ලෙස සැලකීම අතිශයෝක්තියක් නොවේ. එපමණක් නොව බටහිර ආභාෂයෙන් ලද බටහිර සංගීතයත් පෙරදිග ආභාෂයෙන් ලද පෙරදිග සංගීතයත් යම් සුවිශේෂිත වූ මාවතක තිබීම වැදගත් වේ. ඒ අනුව නූතන උසස් හෙළ සංගීතයෙන් බිහි වූ අමරදේවයන් ගේ පරපුර අප සංගීතයේ ක්ෂේමභූමියක්ම විය.

■

**මහින්ද දිසානායක දිවුල්ගනේ**

විශේෂයෙන් ඩබල් බේස්, යතුරු පුවරු, ට්‍රම්පට් ඩ්‍රම්ස් වැනි සංගීත භාණ්ඩ ක්‍රමයෙන් අපේ සංගීතයට නැතිවම බැරි භාණ්ඩ බවට පත්විය. අපේ සංගීතයේ නව නැම්මක් ඇති කරමින් බොම්බායේ සිට පැමිණි පර්සි නාට්‍ය කණ්ඩායමක් මෙහිදී සංගීතය සඳහා විශේෂ මෙහෙවරක යෙදී තිබේ.

**The High Commission For Sri Lanka**

## Investment Opportunities in Sri Lanka

As you are aware, the government of Sri Lanka has introduced a wide range of incentive schemes for foreign investors to commence projects through the Board of Investment (BOI) which is an autonomous statutory body with wide ranging powers to facilitate foreign investments. It promotes export oriented industries and seeks to attract foreign technology transfer and industrial development. The BOI is a one-stop-shop located in the capital of Sri Lanka which does the liaisoning of all government and semi-government agencies to promote investments.

The Sri Lanka High Commission in its programme for investment generation in Sri Lanka through Australian entrepreneurs obtained the approval of the BOI for several packages of development projects..

The socio-economic conditions available in Sri Lanka including infrastructure development have contributed in a big way to facilitate investment in industrial, agricultural, livestock farmning, power generation, hotel industry, information technology and several other sectors. The GDP growth rate in the first half of 2005 has risen to 6% and the industrial sector has registered a growth rate of 5.2% in 2004. In the sector of factory industry, the largest sub sector in manufacturing arena has expanded by 6.1%in the last year. Sri Lanka now has a well developed road network, telecommunication system, information technology network and also a technically qualified labour force. Tourism has increased by 8% during the first half of this year and the last year by 13.1%. In spite of the Tsunami devastation that damaged the coastal belt of Sri Lanka.

Any further information or any clarification on any of the above projects can be had directly from the BOI (address below) or the Counsel General in Sydney (Tel: 02 9223-8729) or the High Commission in Canberra (Mr. Cyril Gunapala, Minister In-charge of Investment and Economic Affairs - Tel: 02 6239-7041)

Address of the BOI:
Mr. Saliya Wickramasuriya
Chairman/Director General
Board of Investment
Level 26, West Tower
World Trade Centre
Colombo 01
Sri Lanka

Tel: (+94 11) 2427000
Fax: (+94 11) 2447995